# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1836/36 - 2013 නොවැම්බර් මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2013.11.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

නිසා/නි7/එල්ජී/2020.

ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම 2013.01.09 දිනැති අංක 1792/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ 1 A පිටුවේ අංක 01 - 640 යටතේ පල කරන ලද නිවේදනයේ උප ලේඛනයෙහි "ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය නානාත්තන් යනුවෙන් ද, ග්‍රාම නිලධාරි වසම මුරුන්කන් යනුවෙන්ද, ඉඩම පිහිටි ගමේ නම මුරුන්කන්" යනුවෙන්ද සඳහන් වුවත් එය "ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මන්නාරම යනුවෙන්ද, ග්‍රාම නිලධාරි වසම උයිර්තරාසන්කුලම්, යනුවෙන්ද ඉඩම පිහිටි ගමේ නම උයිර්තරාසන්කුලම්" යනුවෙන්ද සංශෝධනය කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2013 නොවැම්බර් මස 07 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/987.

11 - 1057


1A - G 18545 — 175 (2013/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නිසා/නි7/එල්ජී/1753.

## ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම 2011.06.13 දිනැති අංක 1710/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ 3 A පිටුවේ අංක 06 - 26 යටතේ පල කරන ලද නිවේදනයේ උප ලේඛනයෙහි ඉඩමේ නම කුඹුරු ඉඩම යනුවෙන් සඳහන් වූවත්, එය වව්නියාව මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක : MA/NNT/2013/035 දරන ප්‍රගමන අනුරේඛනයේ දැක්වෙන පරිදි ඉඩමේ නම "කඩ්ඩුකානි" යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2013 නොවැම්බර් මස 07 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/913.

11 - 1058

---

නිසා/නි7/එල්ජී/1824.

## ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම 2012.01.31 දිනැති අංක 1743/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ 1 A පිටුවේ අංක 02 - 515 යටතේ පල කරන ලද නිවේදනයේ උප ලේඛනයෙහි ඉඩමේ නම කුඹුරු ඉඩම යනුවෙන් සඳහන් වූවත්, එය වව්නියාව මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක : MA/NNT/2013/038 දරන ප්‍රගමන අනුරේඛනයේ දැක්වෙන පරිදි ඉඩමේ නම "කඩ්ඩුකානි" යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2013 නොවැම්බර් මස 07 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/956.

11 - 1059

LA/2133.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට, මාතර IV වන අදියර ජල යෝජනා ක්‍රමය යටතේ ගල්කැටිය භූගත ජලාශය හා ස්ථාන භාරකරු නිල නිවාසය ඉදිකිරීම සඳහා ඉඩම් කොටස් 02ක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස්වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2013 නොවැම්බර් මස 07 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1010.

*උපලේඛනය*

මාතර දිස්ත්‍රික්කයේ තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 349 B, කිතලගම මධ්‍යම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කිතලගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක P. P. A/65 දරන පිඹුරේ අංක If හා Iy යන ඉඩම් කොටස් වලින් සම්පූර්ණ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.150 (පර්චස් 60) ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ බදුලු කැලේ ඉඩම් කොටස් :–

01. කැබලි අංක If වලින් හෙක්ටයාර් 0.075 (පර්චස් 30)

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | P. P. A/65 හි කැබලි අංක IG හා IJ යන ඉඩම් කොටස් ; |
| *දකුණට* | : | නිවාස වලට යන පාර ; |
| *බටහිරට* | : | P. P. A/65 හි 1 AE ඉඩම හා මෙම ඉඩමේ ඉතිරි කොටස්. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* 1. බී. කහඳගමගේ මහතා,
මැදවත්තහේන,
කිතලගම මධ්‍යම,
තිහගොඩ.

02. කැබලි අංක IY වලින් හෙක්ටයාර් 0.075 (පර්චස් 30)

| | | |
|---|---|---|
| *උතුරට* | : | P. P. A/65 හි කැබලි අංක IG ඉඩම ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | නිවාස වලට යන පාර ; |
| *බටහිරට* | : | නිවාස වලට යන පාර හා P. P. A/65 හා If හා IZ යන ඉඩම් කොටස්. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* 1. එල්. එම්. තිලකසිරි මහතා,
හේනපාමුල ගෙදර,
අංක 03,
කිතලගම නැගෙනහිර,
තිහගොඩ.

11 - 1060

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.